# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

2025 ජූලි

**සමාජීය විද්‍යා පීඨය**

**ඉතිහාසය**

**ක්‍රි.ව. 1597 සිට 1978 දක්වා නූතන ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය**

**HIST 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. 1597 න් පසු කෝට්ටේ රාජ්‍යයේ පරිපාලන තන්ත්‍රය පවත්වාගෙන යාමේ දී පෘතුගීසීන් කෙතෙක් දුරට පැවති ක්‍රමය උපයෝගී කරගත්තේ දැයි විමසන්න.

02. සිය ආගම ප්‍රචාරය කිරීමේ මාධ්‍යයක් ලෙස ලංකාවේදී ලන්දේසීන් අධ්‍යාපනය උපයෝගී කරගත් අයුරු විමර්ශනය කරන්න.

03. 17 සහ 18 වන සියවස්වලදී බෞද්ධාගම මුහුණ දුන් අභියෝග පිළිබඳව විමසා 18 වන සියවසේ දී උඩරට රාජ්‍යය තුළ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය පිළිබඳව සාකච්ඡා කරන්න.

04. 1796 සිට 1815 දක්වා ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බ්‍රිතාන්‍ය පාලනය පවත්වාගෙන ගිය ආකාරය විමසන්න.

05. වතු වගා ආර්ථිකය වර්ධනයවීමෙහිලා කෝල්බෲක්- කැමරන් ප්‍රතිසංස්කරණ කෙතෙක්දුරට බලපෑවේ දැයි පරීක්ෂා කරන්න.

06. "1848 දී ඇති වූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයට හේතු වූයේ ගොවි ජනතාව මුහුණ දුන් ගැටලු පමණක් ද?" සාකච්ඡා කරන්න.

07. 19 වන සියවසේ ඇති වූ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය කෙබඳුදැයි පරීක්ෂා කරන්න.

08. ලංකා ජාතික සංගමය බිහිවීමට තුඩුදුන් පසුබිම සැකෙවින් දක්වා 1948 දක්වා එහි ක්‍රියාකාරිත්වය විමසන්න.

09. 1956 දේශපාලන පරිවර්තනයට තුඩු දුන් පසුබිම සාකච්ඡා කරන්න.

10. "1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අගමැතිට පැවරී තිබූ බලතල 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට පැවරී ඇත." සාකච්ඡා කරන්න.

****************************